**ආණ්ඩුවේ නිවේදන**

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 ඇ වගන්තිය යටතේ නියමය**

2009 අංක 14 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතින් අවසන් වරට සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනය I මගින් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ නිෂ්පාදන බදු ගෙවීමෙන් නිදහස් වන බව හා උපලේඛන II මගින් නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා නිෂ්පාදන බදු සහනයන් 2010.11.23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි හිමි වන බව මෙම නියමය මගින් ප්‍රකාශයට පත් කරමි.

2005 මැයි 5 වන දිනැති අංක 1391/21 දරන ගැසට් නිවේදනය, 2007 අප්‍රේල් 11 වැනි දිනැති අංක 1492/9 දරන ගැසට් නිවේදනය, 2008 නොවැම්බර් 06 වැනි දිනැති අංක 1574/9 දරන ගැසට් නිවේදනය, 2009 මාර්තු 04 වැනි දිනැති 1591/10 දරන ගැසට් නිවේදනය සහ 2010 ජුනි 02 වැනි දිනැති 1656/25 දරන ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයන් මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**මහින්ද රාජපක්ෂ**
**මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය**

2010 . 11.19 වැනි දින
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
කොළඹදී ය

**උපලේඛනය I**

1. පහත සඳහන් බාණ්ඩවලට අයත් ආනයනය කරන ලද මෝටර් රථ වාහන/ භාණ්ඩ,

   (අ) විදේශ දූත මණ්ඩලයන්හි සේවය කරන ශ්‍රී ලාංකික තානාපති නිලධාරීන් විසින් වර්ෂ 2000.04.07 දිනැති අංක 165 දරන විදේශ අමාත්‍යාංශ චක්‍රලේඛ යටතේ ආනයනය කරනු ලබන මෝටර් රථ;

   (ආ) ශ්‍රී ලාංකා රජය විසින් විදේශීය සංවිධාන හා විදේශීය රාජ්‍යයන් සමග එළඹි නොයෙකුත් ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් යටතේ ආනයනය කරනු ලබන මෝටර් රථ;

   (ඇ) රාජ්‍ය සේවකයෙකු විසින් 1999.10.08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා එයට කරන ලද සංශෝධනවලට අනුකූලව ආනයනය කරනු ලබන මෝටර් රථ;

(ඇ) අතිගරු ජනාධිපතිතුමා විසින් නියම කරනු ලබන පරිදි රට වෙනුවෙන් විශිෂ්ඨ සේවාවක් ඉටු කරන ලද කිසියම් තැනැත්තෙකු විසින් ආනයනය කරනු ලබන හෝ එබඳු පුද්ගලයන් හට පරිත්‍යාග වශයෙන් ලැබෙන වාහන;

(ඉ) ශ්‍රී ලංකා ජාතිය ගොඩනැගීමේ බැදුම්කරයක මුල් අයිතිකරුවන් විසින් භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයන්ට අනුකූලව සහනදායී බදු යටතේ ආනයනය කරනු ලබන මෝටර් රථ;

2. රජයේ විශේෂ නියෝග යටතේ භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද ආපදා හෝ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අදාල විශේෂ නියෝගවලට අනුකූලව ආනයනය කරනු ලබන භාණ්ඩ.

3. කර්මාන්ත විෂය භාර ඇමතිවරයා විසින් නිර්දේශිත 30% කට නොඅඩු දේශීය එකතු කළ අගයක් සහිතව අළුත් වාහන උපාංග යොදා ගනිමින් දේශීයව එකලස් කළ/නිෂ්පාදිත වාහන. එහෙත් සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 87.03 අනුව, මෙම නිදහස් කිරීම අයිතම (3) අදාළ කොන්දේසිවලට යටත්ව, III වැනි උපලේඛනයෙහි දැක්වෙන සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතට ගැනෙන වාහනවලට පමණක් අදාළ වේ.

4. කර්මාන්ත විෂය භාර ඇමතිවරයා විසින් නිර්දේශිත 30% කට නොඅඩු දේශියව එකලස් කළ/ එකතුකළ අගයක් සහිතව මෙරට නිෂ්පාදනය කරනු ලබන සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 84 සහ 85 කාණ්ඩයන්ට අයත්වන භාණ්ඩ.

5. රේගු ආඥාපනතේ 107 වන වගන්තිය යටතේ පනවනු ලැබ ඇති මගීන්ගේ ගමන් බඩු (නිදහස් කිරීම්) රෙගුලාසි යටතේ තීරු බදු රහිතව නිෂ්කාෂණය කර ගැනීමට හිමිකම් ලබන සෑම භාණ්ඩයක්ම,

6. නැව් ගබඩා බඩු ලෙස පාවිච්චි කිරීම සඳහා ප්‍රතිඅපනයනය කිරීම පිණිස බන්ධිත ගුදම්න් නිශ්කාෂණය කරනු ලබන සෑම භාණ්ඩයක්ම,

7. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කර යම් අපනයනකරුවෙකු වෙත සපයනු ලබන සෑම භාණ්ඩයක්ම එම නිෂ්පාදනය කරන ලද භාණ්ඩය අපනයනය කරන ලද බවට නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත්වන ආකාරයට ලියකියවිලි ඉදිරිපත් කරන්නේනම් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත එවැනි භාණ්ඩ,

8. භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියට යටත්ව, ලියාපදිංචි අවමංගල්‍ය සේවා සපයන්නන් විසින් ආනයනය කරනු ලබන අවමංගල්‍ය රථ.

9. ඒකාබද්ධ අරමුදල් උපයෝගී කර ගනිමින් රජයේ ආයතන විසින් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත මූල්‍ය කල්බදු හෝ සෘජුව මිලදී ගැනීම මගින් ආනයනය කරනු ලබන හෝ දේශීයව නිෂ්පාදනය කරනු ලබන මෝටර් රථ

## උපලේඛනය II

1. රාජ්‍ය සේවකයෙකු විසින් 2010. දිනැති 2010/01 දරන වෙළෙඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයට අනුකූලව අදාල නිශ්චිත සහනයන් සහිතව ආනයනය කරනු ලබන මෝටර් රථ .

## උපලේඛනය III

**පෙට්‍රල් වාහන :**

| *ශීර්ෂ අංකය (1)* | *සංයෝජිත වර්ගීකරණ සංකේතය (2)* | *විස්තරය (3)* |
|---|---|---|
| **87.03** | | **(87.02 ශීර්ෂයේ ඒවා හැර), ස්ටේෂන් වැගන් සහ රේසින් කාර් ඇතුළු ප්‍රධාන වශයෙන් පුද්ගලයින් ප්‍රවාහනය කිරීම සඳහා සැලසුම් කරන ලද මෝටර් කාර් සහ අනෙකුත් මෝටර් වාහන** |
| | **8703.21** | **සිලින්ඩර් ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,000 නොඉක්ම වූ:** |
| | 8703.21.60 | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව, අවුරුදු තුනහමාරකට වඩා නොපැරණි මෝටර් කාර් |
| | **8703.22** | **සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,000 ඉක්මවූ එහෙත් ඝන සෙන්ටි මීටර 1,500 නොඉක්ම වූ :** |
| | 8703.22.50 | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව, අවුරුදු තුනහමාරකට වඩා නොපැරණි මෝටර් කාර් |
| | 8703.23.51 | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,600 නොඉක්ම වන |

**ඩීසල් වාහන :**

| *ශීර්ෂ අංකය (1)* | *සංයෝජිත වර්ගීකරණ සංකේතය (2)* | *විස්තරය (3)* |
|---|---|---|
| | **8703.31** | **සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,500 නොඉක්ම වූ:** |
| | 8703.31.70 | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව, අවුරුදු තුනහමාරකට වඩා නොපැරණි මෝටර් කාර් |
| | | ස්ටේෂන් වැගන් සහ රේසිං කාර් ඇතුළුව, සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 2,000 නොඉක්මවන, අවුරුදු තුනහමාරකට වඩා නොපැරණි මෝටර් කාර් : |
| | 8703.32.51 | සිලින්ඩර ධාරිතාවය ඝන සෙන්ටි මීටර 1,600 නොඉක්මවන |
| | 8703.32.59 | අනෙකුත් |
| | 8703.32.71 | රියදුරු ඇතුළුව පුද්ගලයින් (වැඩිහිටියන්)7 හෝ වැඩියෙන් ප්‍රවාහනය සඳහා ඉණිමඟක ආකාර වැසියකට ඇණ මුරිච්චි මගින් සවිකරන ලද එකීය බඳක් සහිත නොවූ නිබඳවම රෝද හතරම ඇන්ජිමෙන් කරකවනු ලැබිය හැකි සමස්ත දැරිය හැකි බර කිලෝ ග්‍රෑම් 800 ඉක්මවිය හැකි (පුද්ගලයින් හා භාණ්ඩ බර) වාහන |
| | 8703.32.79 | අනෙකුත් |